# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,673 — 1966 පෙබරවාරි 17 වැනි බ්‍රහස්පතින්දා — 1966.2.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 49 |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 50 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍රවිනිශ්චයකාර ධුරන්ධර මිලියානි ක්ලෝඩ් සන්සෝනි වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා, එයට සෑහෙන කරුණු පෙනී, 1966 පළමු වැනි උතුරු චාරිකාව සඳහා යාපනයේ පැවැත්වීමට නියමිත ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාරය ඇරඹීමේ දිනය 1966 මැයි මස 5 වැනි ගුරු දිනට යොදන ලෙස මෙයින් නියම කරමි.

එම්. සී. සන්සෝනි,
අග්‍රවිනිශ්චයකාර.

1966 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹදීය.

2-620

---

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

---

**නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින අඟලකට රු. 10ක් සහ වැඩිවන සෑම අඟලක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10 බැගින් අය කරනු ලබන ගාස්තුව වෙනුවට, 1966 මාර්තු මස 1 වෙනි දින සිට, වෙළඳ ලකුණු දැන්වීම් හැර, අන් සියළුම දැන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 15 බැගින්ම අය කරනු ලබන බව සැමදෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.**

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 පෙබරවාරි මස 11 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.


49——ඕ 64121—2,955 (66/2)

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## දකුණු පළාත

### මාතර දිස්ත්‍රික් නඩුශාලාවේදීය

මාතර, බුවුන්හිල්ස් හි/දොන් විවියන් පලිහක්කාර අමරසේකර ........................................................ පැමිණිලිකාරයා.

නොම්මරය : ඈම්. 1454.

එදිරිව

තෙලිජ්ජවිල, කුමාරදාස වත්තේ/කුමරදාස කරුණානායක ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයන් රුපියල් 2,611.86½ ක් අයකර ගැනීම පිණිස වර්ෂ 1966 ක්වූ මාර්තු මස 15 දින උදය 10 පැයට පටන්ගෙන එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. මාතර ඉඩම් කන්තෝරුවේ ලියාපදිංචි කළ ඕ 377/188 හි සඳහන් දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කේ වැලිගම් කෝරළේ හොරගොඩ පිහිටි රුකවල් වත්ත නමැති පී. පී. 185431 දරණ ඉඩමට මායිම් උතුරට : පී. පී. 119478 සහ පී. පී. 119477 ද ; නැගෙනහිරට : පී. පී. 119477 සහ පී. පී. 1248 වේ සඳහන් X 565 ද ; දකුණට : පී. පී. 1248 වේ සඳහන් X 565 සහ W 565 ද ; බස්නාහිරට : පී. පී. 1248 වේ සඳහන් W 565 සහ පී. පී. 119478 ද, යන මායිම් තුල අක්කර 1 කුත් රූඩ් 2 කුත් පර්චස් 32 ක් විශාල ඉඩමේ සියලු ගහකොළ පළතුරු සමග බිම සහ එහි ඇති ගොඩනැගිලිද වේ.

2. මාතර ඉඩම් කන්තෝරුවේ ලියපදිංචි කළ ඕ 525/106 හි සඳහන්, ඉහතකී හොරගොඩ පිහිටි මාරගහවත්ත (සමහර විට ව්‍යවහාර කරන දිවෙල් වත්ත) නමැති ඉඩමේ බෙදාවෙන්කරන ලද ලොට් නොම්මර 1 දරණ කැබැල්ලට මායිම් උතුරට : කුමාරදාස වත්තේ කොටසක් වූ පැඟිරිහේන ද ; නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් නොම්මර 3 දරණ කැබැල්ලද ; දකුණට : මෙම ඉඩමේ ලොට් නොම්මර 2 සහ 3 දරණ කැබැලිද ; බස්නාහිරට : බෙලිමුල්ල ද යන මායිම් තුල රූඩ් 1 කුත් පර්චස් 35.75 ක් විශාල ඉඩමේ සියලු ගහකොළ පළතුරු සමග බිම වේ.

ඩී. ඊ. සහබන්දු,
අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1966ක්වූ පෙබරවාරි මස 6 වෙනි දින,
මාතර පිස්කල් කන්තෝරුවේ දීය.

2-501

### මාතර දිස්ත්‍රික් නඩුශාලාවේ දී ය

මාතර, රාහුල පාරේ/කන්දළඩ ආරච්චිගේ හරිස්චන්ද්‍ර ........................................................ පැමිණිලිකාරයා.

නොම්මරය : ඈම්. 2277

එදිරිව

වරල්ල, යජ්ලන්ඩ් වතුයායේ/මැන්දිස් දහනායක යාපා ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රුපියල් 11,186.73½ක් සහ මෙයින් ගෙවනලද රුපියල් 3,000 අඩුකර අයකර ගැනීම පිණිස වර්ෂ 1966 ක්වූ මාර්තු මස 22 දින උදය 10 පැයට පටන්ගෙන එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කේ මොරවක් කෝරළේ හොරගල පිහිටි උතුරට : පී. පී. 171800 දරණ ප්ලෑනයේ සඳහන් 35 වෙනි කැබැල්ල සහ කපුවා දොල දිගේ වැටී තිබෙන දොලට අත්හරිනලද බිම් කැබැල්ලද ; නැගෙනහිරට : කපුවා දොල දිගේ අත් හරිනලද බිම් කැබැල්ල සහ 27ඒ කේ දරණ බිම් කැබැල්ලද ; දකුණට : 27ඒ කිව් දරණ බිම් කැබැල්ලද ; බස්නාහිරට : 27 ඒ පී. 32, 33, 34 ඒ2, 34 ඒ1 සහ පී. පී. 365692 දරණ බිම් කැබැල්ලද යන මායිම්තුල සර්වෙයර් ජනරාල් නැන්පත් ඒ. එච්. ජී. ඩෝසන් මහතා විසින් සහතික කරන ලද මාතර දිස්ත්‍රික්ක්කේ ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඈජ් 129/148 සහ ඈජ් 128/294 යටතේ ලියාපදිංචි කරන ලද 1931.7.31 දින දරණ අංක 4588 දරණ ප්ලෑනයේ සඳහන් පරිදි අක්කර 22 පර්චස් 33ක් විශාල දැනට තේ වත්තක් වන ආණ්ඩුව සතු දෙලපල්ලෙහේන්යාය නමැති ඉඩමේ 1931.4.1 දින ආරම්භ වූ 99 අවුරුදු බද්දෙන් ඉතිරි කොටසින් විත්තිකරුගේ සියලු බදු අයිතිවාසිකම් වේ.

2. ඉහතකී මොරවක් කෝරළේ වරල්ලේ පිහිටි උතුරට සහ නැගෙනහිරට : වතුර පාර (දෙල) ; දකුණට : හෙට්ටියා වත්ත සහ බස්නාහිරට : ගෙදරලියද්ද සහ උඩදෙනිය ගෙදරලියද්ද යන මායිම් තුළ මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඈජ් 154/115 යටතේ ලියාපදිංචි කරන ලද අක්කර 2, රූඩ් 0, පර්චස් 37ක් විශාල තල්ගහවත්ත නමැති ඉඩමේ බිමද, පළතුරු සහ සියලු ගොඩනැගිලිද එහි තිබෙන බාහිර ගෙවල් ද වේ.

ඩී. ඊ. සහබන්දු,
අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1966ක්වූ පෙබරවාරි මස 6 වෙනි දින,
මාතර පිස්කල් කන්තෝරුවේ දීය.

2-550

### මාතර දිස්ත්‍රික් නඩු ශාලාවේ දීය

තිස්සමහාරාම, උඩුවිල/ඩබ්ලිව්. ජී. දෙන් අන්ද්‍රයස් ........................................................ පැමිණිලිකාරයා.

නොම්මරය : ඈල්. 945.

එදිරිව

නාදුගල, ගොඩැල්ලකන්දෙ/මලවිලසූරියගෙයි කර්ලිනාහාමි ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරිට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රුපියල් 5,816.54ක් අයකර ගැණීම පිණිස වර්ෂ 1966 ක්වූ මාර්තු මස 17 දින උදය 10 පැයට පටන්ගෙන එම ඉඩම්වල දී ප්‍රසිඩ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කේ ගංගබඩ පත්තුවේ නාදුගල පිහිටි උතුරට : මහපාරද ; නැගෙනහිරට : මෙම ඉඩමේ ජී අක්ෂරයද ; දකුණට : රත්නෙඅද්දරද ; බස්නාහිරට : මෙම ඉඩමේ ඩී අක්ෂරයද යන සතර මායිම් තුළ පිහිටි පර්චස් 35 2/3ක් විශාල කුනියන්මුල්ල නොහොත් හුනියන්මුල්ල නමැති ඉඩමේ ඒකාබඩ ඊ සහ ඈජ් අක්ෂරවල තිබෙන සියළුම ගොඩනැගිලි සහ ගහකොළ පළතුරු ඇතුළු බිමෙන් නොබෙදු 1/2 පංගුවක් වේ.

2. ඉහත කී නාදුගල පිහිටි උතුරට : මහපාරද ; නැගෙනහිරට : සම්පූර්ණ ඉඩමේ ඊ අක්ෂරයද ; දකුණට : රත්නෙඅද්දරද ; බස්නාහිරට : මෙම ඉඩමේ ඩී අක්ෂරයෙන් ඒ අක්ෂරයද මායිම් වූ පර්චස් 26.3 ක් විශාල කුනියන්මුල්ල නොහොත් හුනියන්මුල්ල නමැති ඉඩමේ බෙදා වෙන්කරන ලද ඩී අක්ෂරයෙ බී අක්ෂරයෙ අයිතිවාසිකම්වලින් නොබෙදු ½ පංගුව වේ.

3. ඉහත කී නාදුගල පිහිටි උතුරට : බොරලුකැටියෙහේනද ; නැගෙනහිරට : රූපසිංහ ජයවර්ධන දොන් තොලොනිස්ගෙවත්තද ; දකුණට : ආරච්චිගෙහේනද ; බස්නාහිරට : නාරන්ගෙදරද යන සතර මායිම් තුළ පිහිටි අක්කර ½ ක් පමණ විශාල දුනුකෙයියාගහවත්ත නොහොත් දෙවරාවගෙවත්ත නමැති ඉඩමේ සියළුම ගහකොළ සමග බිමෙන් නොබෙදු 1/12 පංගුවේ අයිතිවාසිකම වේ.

ඩී. ඊ. සහබන්දු,
අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1966ක්වූ පෙබරවාරි මස 5 වෙනි දින,
මාතර පිස්කල් කන්තෝරුවේ දී ය.

2-553

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**(සෑම සිකුරාදා දිනයක්හි පළ කරනු ලැබේ)**

**1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.**

**2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති නැතට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.**

3. පෝය දිනවලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කායාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.**

6. ප්‍රමාදය සහ දෝෂ වළක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.**

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

**8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.**

**9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.**

10. 1966 මාර්තු මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 15 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 15 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 165 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 330 | 0 |

**අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.**

**11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නැතට ලැබෙන සේ එවිය යුතුයි.

**13. 63.8.1 දින සිට සංශොධිත දායක ගාස්තු :—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 17 50 | ... | 23 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 25 0 | ... | 33 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිල රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 60 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදනය බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දූන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය
### 1966

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දූන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු ... | 66. 3. 4 | සිකුරාද | ... | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.11 | සිකුරාද | ... | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.18 | සිකුරාද | ... | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.25 | සිකුරාද | ... | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් ... | 66. 4. 1 | සිකුරාද | ... | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4. 7 | බ්‍රහස්පතින්ද | ... | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 4.15 | සිකුරාද | ... | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.22 | සිකුරාද | ... | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.29 | සිකුරාද | ... | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි ... | 66. 5. 6 | සිකුරාද | ... | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | 66. 5.13 | සිකුරාද | ... | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.20 | සිකුරාද | ... | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.27 | සිකුරාද | ... | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි ... | 66. 6. 3 | සිකුරාද | ... | 66. 5.25 | බදාද | දවල් 12 |
| | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | ... | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | 66. 6.16 | බ්‍රහස්පතින්ද | ... | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66. 6.24 | සිකුරාද | ... | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජූලි ... | 66. 7. 1 | සිකුරාද | ... | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | 66. 7. 8 | සිකුරාද | ... | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.15 | සිකුරාද | ... | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.22 | සිකුරාද | ... | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 7.29 | සිකුරාද | ... | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු ... | 66. 8. 5 | සිකුරාද | ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද | ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි